(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 14(3).]

# පාර්ලිමේන්තුවේ අංක 14 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2015 ජූනි මස 05 වැනි සිකුරාදා

## 2015 ජූනි මස 23 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4788/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) එක් වර්ෂයක් තුළ යල සහ මහ කන්න දෙක වගා කිරීම සඳහා අවශ්‍ය බිත්තර වී ප්‍රමාණය කොපමණද;

(ii) දැනට රට තුළ නිෂ්පාදනය කරන බිත්තර වී ප්‍රමාණය කොපමණද;

(iii) අවශ්‍ය බිත්තර වී ප්‍රමාණය නිෂ්පාදනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) බීජ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ජාතික බීජ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5575/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) දැනට ක්‍රියාත්මක වන ආයුර්වේද පනත හඳුන්වා දුන් වර්ෂය කවරේද;

(ii) මේ වන විට එම පනත සංශෝධනය කර ඇති වාර ගණන කොපමණද;

(iii) එය අවසන් වරට සංශෝධනය කළ වර්ෂය කවරේද;

(iv) මෙතෙක් එම පනත සංශෝධනය කර නොමැති නම්, එයට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් හඳුන්වනු ලබන්නේ වෛද්‍ය නිලධාරීන් ලෙස ද; නැතහොත්, වෛද්‍ය වෘත්තිකයන් ලෙස ද;

(ii) ඔවුන් එම නාමයෙන් හැඳින්වීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5708/'14

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2011 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව 2011 ජන සෙවණ නිවාස දස ලක්ෂය නිවාස සහ ජනාවාස මෙහෙයුම යටතේ මොණරාගල දිස්ත්‍රික්කය තුළ නිවාස පහසුකම් ලබාදීමට හඳුනාගත් මුළු පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එකී යෝජනා ක්‍රමය යටතේ නිවාස පහසුකම් ලබාදුන් පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම යෝජනා ක්‍රමය සඳහා වැය කළ මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එකී මුදල් ලබා ගත් ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 ජන සෙවණ නිවාස දස ලක්ෂය නිවාස සහ ජනාවාස මෙහෙයුම යටතේ නිවාස පහසුකම් ලබාදීමට හඳුනාගත් පවුල් වෙත ලිඛිත පොරොන්දුවක් ලබා දී තිබුණේද;

(ii) එකී පොරොන්දුව අනුව මෙතෙක් නිවාස ලැබී නොමැති පවුල් සඳහා නිවාස ලබා දීමට පියවර ගන්නේද;

(iii) ඒ සඳහා ගත වන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5931/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුනාමි ව්‍යසනයෙන් නිවාස අහිමි වූ මාතර දිස්ත්‍රික්කයේ ජනතාවට ලබා දුන් නිවාස සඳහා මේ වන විට ඔප්පු ලබා දී තිබේද;

(ii) එම ඔප්පු ලබා දී නොමැති නම්, ඊට හේතු කවරේද;

(iii) දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දගොඩැල්ල (H.H.O. නිවාස), අභිමන්පුර, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදවත්ත (ලුණුකලපුව), මුදියන්සේවත්ත සහ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාල්ලගේවත්ත, තුඩාව, කොඩිකාර ගොඩනැගිල්ල සහ ලොරන්ට සිටි යන ස්ථානවල ලබා දී ඇති නිවාස සඳහා ස්වාධීනමය දේපළ ලෙස හෝ තනි තනි නිවාස ලෙස හෝ ඔප්පු ලබා දිය හැකි බවට ජාතික නිවාස අධිකාරිය නිර්දේශ කර තිබේද;

(iv) එම නිවාසවලට ඔප්පු ලබාදීමේ කාර්යය සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට පැවරීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබේද;

(v) සහාධිපත්‍ය දේපළ පදනමින් හෝ තනි නිවාස අයිතිය යටතේ හෝ ඉහත (iii) හි සඳහන් නිවාසලාභීන්ට ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5939/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගරු ශිරානි තිලකවර්ධන ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරතුමියගේ සභාපතීත්වයෙන් පත්කරන ලද ආයුධ ජාවාරම ගැන විමසා බැලීම සඳහා වූ කොමිසම විසින් වාර්තාවක් සකසා තිබේද;

(ii) එම වාර්තාව ප්‍රකාශයට පත් කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6034/’15

ගරු විජිත හේරත් මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හෝමියෝපති පනත අනුව වර්ෂ 2006 - 2011 දක්වා කාල සීමාව සඳහා පත්කර තිබූ හෝමියෝපති වෛද්‍ය සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 සහ 14 වගන්තිවලට පටහැනිව 2009.10. 29 දින විසුරුවා හැර ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් 2006 වර්ෂයේ පත්වූ එකී වෛද්‍ය සභාවේ සාමාජිකයන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත්;

(iii) විසුරුවන ලද වෛද්‍ය සභාව වෙනුවට එවකට විෂයභාර අමාත්‍යවරයා විසින් නීත්‍යානුකූල නොවන අතුරු කමිටුවක් පත් කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (iii) හි සඳහන් පත් කිරීම අනුමත කරන්නේද;

(ii) එම අතුරු කමිටුව විසින් සිදු කළ අංක 184 සිට 275 දක්වා වෛද්‍යවරුන් ලියාපදිංචිය තුළින් හෝමියෝපති පනත උල්ලංඝනය වී තිබේද;

(iii) එසේ නම්, එම පත්වීම් අවලංගු කරන්නේද;

(iv) අවලංගු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) හෝමියෝපති පනතේ 20 වැනි වගන්තිය යටතේ ලේඛකාධිකාරීවරයෙකු පත්කිරීමට වෛද්‍ය සභාවකට පමණක් ඇති බලය අභිබවා එවකට පැවති දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එම්. ඒ. පෙරේරා මහතාව ලේඛකාධිකාරී ලෙස පත්කිරීම නීත්‍යානුකූල වන්නේද;

(ii) නොඑසේ නම්, එම පත්කිරීම නිවැරදි කිරීමට ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6042/’15

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් යොවුන් සේනාංක සහ රැකියා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා පසුගිය වර්ෂයේදී හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ මුදල් වෙන් කළ බවත්;

(ii) එම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර මේ වන විට අඩක් නිම වී ඇති බවත්;

(iii) වත්මන් රජය විසින් එම ව්‍යාපෘතිය නවතා දමා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හාරිස්පත්තුව ප්‍රදේශයේ අනාගත දරු පරපුරේ යහපත උදෙසා ඉහත සඳහන් ව්‍යාපෘතිය නැවත ආරම්භ කරන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව - 2012,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය අනුව 2014.09.10 දින ඉදිරිපත් කරන ලද, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(තාක්ෂණ සහ පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.10.10 දින සලකා බලන ලදී.)

*

උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යතුමා,— නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය අනුව 2014.09.24 දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(තාක්ෂණ සහ පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.10.10 දින සලකා බලන ලදී.)

*

උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව - 2012,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2014.08.19 වැනි දින ඉදිරිපත් කරන ලද, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(තාක්ෂණ සහ පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.10.10 දින සලකා බලන ලදී.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2015 ජූනි මස 24 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4828/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මාතර මහ රෝහලට තම ප්‍රථම පත්වීම ලැබූ එහි ප්‍රධාන හෙද නිලධාරිනිය වන මල්කාන්ති ද සිල්වා මහත්මිය මේ වන විට ස්ථාන මාරුවීම්වලින් තොරව එම රෝහලේම වර්ෂ 21 ක් පමණ සේවය කර ඇති බවත්;

(ii) එම හෙද නිලධාරිනිය අවස්ථා කිහිපයකදී ස්ථාන මාරුවීම් ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රජයේ හෙද සේවයේ නියුතු වූ අයට ස්ථාන මාරුවීම් ලබා දීමේදී රජය අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය කවරේද;

(ii) ඉහත අ (ii) හි පරිදි ස්ථාන මාරුවීම ඉල්ලා තිබියදීත්, රජයේ හෙද ස්ථාන මාරු ලබා දීමේ ප්‍රතිපත්තිය මල්කාන්ති ද සිල්වා මහත්මියට වලංගු නොවීමට හේතු කවරේද;

(iii) අදාළ ස්ථාන මාරුවීම් ලබා දීමේ ප්‍රතිපත්තියට අනුව ඇයට ස්ථාන මාරුවීමක් ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඇයට, ඇය ඉල්ලුම් කරන ස්ථානයට ස්ථාන මාරුවීමක් දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5224/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කයේ ඇති මුඩුක්කු නිවාස හා ලැයිම් කාමර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දිස්ත්‍රික්කයේ සිටින නිවාස නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැසිකිළි නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) වැසිකිළි නොමැති නිවාස සඳහා වැසිකිළි ලබා දීමේ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5576/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2012 වර්ෂයේ උපාධිධාරීන්ට රැකියා ලබාදීම සඳහා අයදුම්පත් කැඳවූ අවස්ථාවේදී ඒ සඳහා ඉල්ලුම් කර තිබූ ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් රැකියා ලබා දුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011.12.31 දින වන විට රැකියා විරහිතව සිටි ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2012 වර්ෂයේදී ඔවුන්ට රැකියා ලබාදීම සඳහා වැඩපිළිවෙළක් සකසා තිබුනේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iv) ඒ යටතේ රැකියා ලබා දුන් ආයුර්වේද වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5927/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පදවි, ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මායිම්ව, කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි, තෙන්නමරවාඩිය ග්‍රාම නිලධාරි වසමෙහි හා තදාසන්න ප්‍රදේශයට අයත් තොරංකාඩුව, 2 කණුව, 4 කණුව, තෝරමරිප්පු, බොරවැව, කුල්ලකල්ලිය, නෙළුම්වැව යනාදී ගම්වල පදවි ව්‍යාපාරය යටතේ පදිංචි කර සිටි පැරණි භුක්තිකරුවන් හා නව හිමිකරුවන් අතර ඉඩම් ගැටලුවක් උද්ගත වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් උක්ත ප්‍රදේශවලින් පැරණි භුක්තිකරුවන් ජීවිත ආරක්ෂාව පතා ඉවත් වූ පසු, එම ඉඩම්වලට දීමනාපත්‍ර (LDO) ලබා දී අලුත් පිරිසක් පදිංචි කරවූ අය කවුරුන්ද;

(ii) එසේ පදිංචි වූ අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) වාර්ෂික බලපත්‍ර මත එකී ඉඩම්වල පදිංචිව සිටි පැරණි භුක්තිකරුවන් කවුරුන්ද;

(iv) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ඉඩම්වල නීත්‍යානුකූල හිමිකාරීත්වය ඇත්තේ පදවිය ව්‍යාපාරය යටතේ මුල් භුක්තිකරුවන්ටද; නොඑසේ නම්, දීමනාපත්‍ර මත පසුව පදිංචි කරවූවන්ටද;

(ii) ඉහත ගැටලුව නිරවුල් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iii) එම ක්‍රියාමාර්ගය ගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6039/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය රජය මගින් සංවිධානය කර තිබූ 2015 දැයට කිරුළ වැඩසටහන යටතේ රත්නපුර දිස්ත්‍රික්කය සඳහා වූ නිවාස ආධාර වැඩපිළිවෙළට අදාළව ඇහැලියගොඩ ඡන්ද කොට්ඨාසයේ ඇහැලියගොඩ, කිරිඇල්ල හා කුරුවිට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් ඉල්ලුම්කරුවන් 1000 වැඩි පිරිසකගෙන් ඉල්ලුම්පත් ලැබී තිබුණේද;

(ii) එකී ඉල්ලුම්පත් අනුව සකසනු ලැබූ ඇස්තමේන්තු මත අදාළ භාණ්ඩ සැපයීම සඳහා මිල ගණන් හෝ ටෙන්ඩර් කැඳවීමේ කාර්යය රත්නපුර දිස්ත්‍රික් ලේකම්වරයා වෙත යොමු කර තිබුණේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට එම නිවාස ආධාර බලාපොරොත්තුවෙන් සිටින අඩු ආදායම්ලාභීන් එම ආධාර වැඩපිළිවෙළ වත්මන් රජය විසින් අවලංගු කර තිබේදැයි විමසන බව නිලධාරින් ඇතුළු වගකිවයුත්තන් දන්නේද;

(ii) ඒ පිළිබඳව අදාළ නිලධාරීන්ගෙන් විමසා බලා තොරතුරු ලබා ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6046/'15

ගරු විජිත හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනතේ 19 වැනි වගන්තිය අනුව එම අරමුදලේ ප්‍රාරම්භක භාරකරු වන්නේ වෙළඳ විෂය භාර අමාත්‍යවරයා බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වත්මන් වෙළඳ විෂය භාර අමාත්‍යවරයා කවුරුන්ද;

(ii) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර මණ්ඩලයේ භාරකරුවන් හා භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා කවුරුන්ද;

(iii) එම භාරකරුවන් පත්කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර මණ්ඩලය යටතේ පවත්නා නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම සහ නැට්වෙල්ත් සෙක්‍යුරිටීස් සමාගම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(ii) ඉහත සමාගම් සඳහා අධ්‍යක්ෂවරුන් පත්කළ දිනය කවරේද;

(iii) එම අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ වයස කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6064/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් රජයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා සහන පදනම මත යතුරුපැදි ලබා දුන් බවත්;

(ii) නව රජය බලයට පත් වූ පසු සියලු රාජ්‍ය සේවකයින්ට යතුරුපැදි ලබා දෙන බවට ජනාධිපතිවරණයේදී පොරොන්දු වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට යතුරුපැදි ලබා ගැනීමට රු. 25000/- ක අත්තිකාරම් මුදල් ගෙවූ අයටත්, යතුරුපැදි ඉල්ලුම් කළ අන් සියලු දෙනාටත් එම යතුරුපැදි ලබා දීම නවතා තිබේද;

(ii) එසේ නම්, යතුරුපැදි ලබා ගැනීමට අත්තිකාරම් මුදල් තැන්පත් කළ අයට එම මුදල් ආපසු ගෙවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6079/'15

ගරු ටී. බී. ඒකනායක මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමේදී දිවිනැගුම සංවර්ධන නිලධාරීන් තෝරා ගැනීම සිදු කළ ක්‍රමවේදයන් හතර වෙනුවට නව ක්‍රමවේදයන් දෙකක් යටතේ එම තෝරා ගැනීම සිදු කිරීමට සැළසුම් කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා දිවි නැගුම පනත සංශෝධනය කරන්නේද;

(iii) එම නව යෝජනා ක්‍රම දෙක යටතේ මේ වන විට නව සේවකයින් ලෙස අනුයුක්ත වූවන් සඳහා 6% ක විශ්‍රාම වැටුප් දායක මුදල් අයකරගන්නේ කෙසේද;

(iv) දැනට මුල් සේවා කාලය පදනම් කරගෙන දිවි නැගුම සංවර්ධන නිලධාරීන් ලෙස සේවයට බැඳීමට මනාපය පළ කළ සේවකයින්ගේ අර්ථ සාධක අරමුදල් ලබා දීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6091/'15

ගරු රාජිව විජේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ගුණපාල නානායක්කාර මහතා, ඔහු විසින් සිදු කරන ලද මූල්‍යමය අක්‍රමිකතා කිහිපයක් හේතුවෙන් ඩුබායි හි පිහිටි කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ, ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ ප්‍රධානි තනතුරේ වැඩ තහනම් කිරීමකට ලක් වී ඇති බවත්;

(ii) ඩුබායි හි පිහිටි කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ ගිණුමෙන් රුපියල් මිලියන 17.3 ක් ස්වයංක්‍රීය ටෙලර් කාඩ් භාවිතා කරමින් ආපසු ලබා ගැනීමත්, රුපියල් මිලියන 5.6 ක් වටිනා චෙක් පත් හතක් ගෙවීම් වවුචර ඉදිරිපත් නොකර මුදල් කිරීම හෝ තම ගිණුමක තැන්පත් කිරීමත්, ශිෂ්‍යයන්ගෙන් ලැබුණ මුදල සහ බැංකු ගතකරන ලද මුදල අතර රුපියල් මිලියන 35.3 ක වෙනසක් ඇති කිරීමත් මතුකර දක්වමින් සීමාසහිත අර්නස්ට් සහ යංග් උපදේශන සේවා පුද්ගලික සමාගම විසින් වාර්තාවක් සකස් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මහාචාර්ය නානායක්කාර මහතා ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත්කරන ලද්දේ කුමන පදනමකින් ද යන්නත්;

(ii) ඉහත (අ) (ii) හි සඳහන් කරන ලද සිද්ධියට සමාන සිද්ධියක් නැවත ඇති නොවන බවට තහවුරු වී තිබේද යන්නත්;

එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6099/'15

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— සමාජසේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 හා 2014 යන වර්ෂවලදී මිල්කෝ ආයතනය ලැබූ ලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015 වර්ෂයේ මේ දක්වා එම ආයතනය ලබා ඇති ලාභය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට මිල්කෝ සමාගම විසින් කිරි ගොවීන්ගෙන් මිලදී ගන්නා කිරි ලීටර් ප්‍රමාණය ජාතික කිරි නිෂ්පාදනයෙන් කවර ප්‍රතිශතයක්ද;

(ii) ඉදිරි කාලයේදී ජාතික කිරි අවශ්‍යතාවය සැපයීමේදී එම ආයතනය දක්වන දායකත්වය වර්ධනය කර ගැනීම සම්බන්ධයෙන් වන අපේක්ෂිත ඉලක්ක කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6101/'15

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා,— මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ආයෝජන ප්‍රවර්ධන කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයෝජන ප්‍රවර්ධන කලාපය ආරම්භ කළ වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ආයෝජන ප්‍රවර්ධන කලාප පිහිටීම නිසා එම නගරවල ඇති වන රථවාහන තදබදය අවම කිරීමට විශේෂිත වැඩසටහන් ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සීතාවක ආයෝජන ප්‍රවර්ධන කලාපය ස්ථාපිත කිරීමත් සමග අවිස්සාවේල්ල නගරයේ රථ වාහන තදබදය වැඩිවූ බවත්;

(ii) එම ආයෝජන ප්‍රවර්ධන කලාපයට ඇතුල්වන හා ඉන් බැහැර වන රථවාහන වලින් 40%ක් පමණ අවිස්සාවේල්ල නගරය හරහා කෑගල්ල නගරය දෙසට ධාවනය කරන බවත්;

(iii) මෙම රථවාහන තදබදය අවම කිරීම සඳහා කර්මාන්ත උද්‍යානය අසල සිට කෑගල්ල දිස්ත්‍රික්කයේ තල්දූව දෙසට සීතාවක ගඟ හරහා නව පාලමක් ඉදිකිරීමට සැලසුම් කර ඇති බවත්:

එතුමා දන්නෙහිද?

(ඇ) බ්‍රිතාන්‍ය යකඩ පාලම් ව්‍යාපෘතිය යටතේ ඉහත සඳහන් පාලම ඉදිකිරීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4998/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවා ගැනීමේ තරග විභාගය 2006 වර්ෂයේදී පැවැත්වූ පසු නැවත පවත්වනු ලැබුවේ 2012 වර්ෂයේදී බවත්;

(ii) එම නිසා විභාගයට පෙනී සිටිය හැකි උපරිම වයස් සීමාව වන අවුරුදු 28 සීමා ගැටලුවට මුහුණ දෙන, සුදුසුකම් සපුරනු ලැබූ පිරිසක් සිටින බවත්;

(iii) උපරිම වශයෙන් දෙවරක් පෙනී සිටිය හැකි විභාගයට වයස් සීමාව පිළිබඳ ගැටලුව නිසා ඇතැමුන් එක් වරක් පමණක් පෙනී සිට ඇති අතර, ඇතැමෙකුට එක් වරක් හෝ පෙනී සිටීමට නොහැකි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත (අ) (ii) හි වයස් සීමා ගැටලුවට මුහුණ පා සිටින සුදුසුකම්ලත් පිරිසට ලබා දෙන සහන කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2014.02.28 දින වන විට රාජ්‍ය අංශයේ ආයතනයන්හි පැවති ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත පුරප්පාඩු ප්‍රමාණය පිරවීමේදී 2012 වර්ෂයේ තරග විභාගයට පෙනී සිටි, සමත්වීමට අවශ්‍ය නියමිත ලකුණු ප්‍රමාණය ලබා ගත් අයදුම්කරුවන්ට අවස්ථාව ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5580/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ආයුර්වේද වෛද්‍යවරු සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වන සේවා ව්‍යවස්ථාව සකසන ලද වර්ෂය කවරේද;

(ii) එම සේවා ව්‍යවස්ථාව අවසන් වරට සංශෝධනය කළ වර්ෂය කවරේද;

(iii) එය සංශෝධනය නොකළේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5928/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, පුල්මුඩේ පිහිටි, අරිසිමලේ ආසිරිකන්ද පුරාණ රජ මහා විහාරයට අයත් ඉඩම් ඇතුලු පූජනීය දේපළ විවිධ ජාතීන්ගේ අනවසර ග්‍රහණයන්ට ලක්ව ඇති බැවින් එකී විහාරස්ථානයට අයත් ඉඩම් ඉපැරණි සීමා වෙන් කිරීම් අනුව මැන නීත්‍යානුකූලව වෙන්කර දෙන දිනය කවරේද;

(ii) ඇතා නැගි කන්ද විහාරය, යාන්ඔය රජ මහා විහාරය, නාගලෙන රජ මහා විහාරය සහ වෙනත් පෞරාණික විහාරස්ථාන ද අනවසර පදිංචිකරුවන්ගේ හා බෞද්ධ උරුමයන් විනාශ කරන්නන්ගේ ග්‍රහණයට හසුව ඇති බැවින් එම විහාරස්ථානවලට අයත් ඉඩම්වල මැනුම් කටයුතු සිදුකර වෙන්කර දෙන දිනය කවරේද;

(iii) ඉහත විහාරස්ථානවලට අයත් ඉඩම් බව නොදැන එම ඉඩම්වල පදිංචි වී සිටින පවුල් සඳහා වෙනත් ප්‍රදේශයකින් ඉඩම් ලබාදීමට කටයුතු නොකිරීමට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් එක් එක් විහාරස්ථානයට අයත් ඉඩම්වලින් මේ වන විට ඉවත් කළ යුතු බවට හඳුනාගෙන ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පදිංචිකරුවන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6066/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය අතුරු අයවැය මගින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ගිණුම්වල රුපියල් ලක්ෂ 25 දක්වා තැන්පතු සඳහා 15%ක පොළියක් ලබා දීමට යෝජනා කළ බව දන්නේද;

(ii) එම යෝජනාව මේ වන විට ක්‍රියාත්මක වන්නේද;

(iii) ඊට අදාළව ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජයේ බැංකු මගින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රුපියල් ලක්ෂ 10කට වැඩි තැන්පතු සඳහා ඉහත සඳහන් 15% ක පොළිය ලබා දෙන්නේද;

(ii) ඉහත සඳහන් අයවැය යෝජනාව නිසා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ඔවුන්ගේ නමින් රුපියල් ලක්ෂ 10කට වඩා වැඩියෙන් තැන්පතු පවත්වාගෙන යාමට ඉඩ නොදෙන බව දන්නේද;

(iii) එසේ නම්, එයට හේතු කවරේද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 ජූනි මස 25 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5449/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අතීතයේ සිට පැවත එන දේශීය වී වර්ග වගා කිරීම සඳහා කෘෂි රසායන ද්‍රව්‍ය අවශ්‍ය නොවන බවත්;

(ii) දේශීය පැරණි වී ප්‍රභේද වගා කිරීමේදී අවම ජල ප්‍රමාණයක් අවශ්‍ය වන අතර පාරම්පරික ක්‍රම භාවිතයෙන් පරිසරයට හා මිනිසාට සිදුවන හානිය අවම බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට හඳුනාගෙන ඇති, ශ්‍රී ලංකාවේ භාවිතා කළ පැරණි වී වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම වී වර්ගයන්ගේ නම් කවරේද;

(iii) දැනට වගා කරන පැරණි වී වර්ග කවරේද;

(iv) අනෙකුත් පැරණි වී වර්ග වගා නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2014 වන විට දේශීය පැරණි වී වර්ග, බිත්තර වී ලෙස යොදා ගෙන වගා කරනු ලබන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ශ්‍රී ලංකාව පුරා එම බිත්තර වී ව්‍යාප්ත කිරීමට පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5581/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වත්මන් ආයුර්වේද වෛද්‍ය කොමසාරිස්වරයාගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) එම නිලධාරියාට ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් ඇති සුදුසුකම් කවරේද;

(iii) ආයුර්වේද වෛද්‍ය උපාධිධාරියෙකුට සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය තුළ ලබා ගත හැකි ඉහළම වෘත්තීයමය තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5929/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ත්‍රිකුණාමලය - කොඩ්බේ ධීවර වරායේ පිහිටි, විශාල ආදායමක් ලබා ගත හැකි ආපනශාලාව ඉතා අඩු මුදලකට ලබාදීමෙන් රජයට ලැබිය යුතුව තිබූ සැබෑ ආදායම අහිමි වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී ආපනශාලාව පවත්වාගෙන යෑමට ටෙන්ඩරය ලබා දී ඇති අයගේ නම, ලිපිනය හා දුරකථන අංක කවරේද;

(ii) 2015.03.05 දින එම ටෙන්ඩර්ලාභියා හා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව අතර ඇති කරගෙන තිබෙන ගිවිසුම මඟින් එම ආපනශාලාවේ මාසික කුලිය රු. 10,000/- දක්වා අඩු කිරීමට හේතුව කවරේද;

(iii) ඉහත සඳහන් ටෙන්ඩර්කරු විසින් පසුගිය කාල සීමාව තුළ දිගින් දිගටම නියමිත බදු මුදල් නොගෙවා එම ආපන ශාලාව පාලනය කර ඇති බවට චෝදනා ලබා තිබියදීත්, රජයට විශාල මුදලක් අහිමිවන පරිදි ඉහත අයුරින් කටයුතු කිරීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත ආපනශාලාව සඳහා ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීමක් සිදු නොකිරීමට හේතු කවරේද;

(ii) ඉදිරියේදී ඊට අදාළව ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීමක් සිදු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6067/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් 2014 නොවැම්බර් මස ඉදිරිපත් කළ අයවැය යෝජනා මගින් පෙර පාසල් ගුරුවරුන් සඳහා මාසිකව රු. 2500 ක දීමනාවක් ලබා දීමට යෝජනා කර තිබුණේද;

(ii) වත්මන් රජයේ මුදල් අමාත්‍යවරයා ඉදිරිපත් කළ 2015 අතුරු අයවැය මගින් පෙර පාසල් ගුරුවරුන්ට මාසිකව රු. 250 ක දීමනාවක් ලබා දීමට යෝජනා කරනු ලැබුවේද;

(iii) මේ වන විට ඉහත යෝජනා දෙකම ක්‍රියාත්මක වන්නේ ද; නැතහොත්, එක් යෝජනාවක් පමණක් ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6080/'15

ගරු ටී. බී. ඒකනායක මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ දී දිවිනැගුම සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අඩු ආදායම්ලාභීන්ගේ ජීවනෝපායන් ඉහළ නැංවීමට නියමිත ටෙන්ඩර් පටිපාටිය තුළ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධන භාණ්ඩ ලබා දීමට කටයුතු කළ නමුත්, මේ දක්වා එම භාණ්ඩ සැපයුම්කරුවන් හට මුදල් ගෙවා නැති බව දන්නේද;

(ii) එම මුදල් ගෙවීම ප්‍රමාදවීමට හේතු කවරේද;

(iii) එම මුදල් ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6102/'15

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා,— නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීතාවක ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි හංවැල්ල සතිපොළෙහි පළමු අදියර ඉදිකිරීම සඳහා එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් රුපියල් මිලියන 65ක් වෙන් කර තිබූ බව දන්නේද;

(ii) නාගරික සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන එම ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් අවසන් වන දිනය කවරේද;

(iii) නාගරික සංවර්ධන අධිකාරිය මගින් සකස් කළ හංවැල්ල නගර සංවර්ධන සැලැස්මට අනුව එම සතිපොළෙහි දෙවැනි අදියර ඉදිකිරීම සඳහා හඳුනාගෙන ඇති යාබද ඉඩම් කොටස අත්පත් කරගැනීමට අවශ්‍ය කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හංවැල්ල නගර මධ්‍යයෙහි ඇති බස් නැවතුම්පොළ හා ඒ ආශ්‍රිත භූමිය සඳහා නව සංවර්ධන සැලැස්මක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම නව සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5450/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගනුදෙනුකරුවන් වෙත ආරක්ෂිත සේප්පු සේවාව ලබා දෙන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් මූල්‍ය ආයතන කවරේද;

(ii) යම් මූල්‍ය ආයතනයක ආරක්ෂිත සේප්පු සේවාව ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අවසර ලබා ගත යුත්තේද;

(iii) එසේ නම්, එම අවසරය ලබා ගැනීම සඳහා මූල්‍ය ආයතනයක් සපුරා ගත යුතු සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ආරක්ෂිත සේප්පු සම්බන්ධයෙන් එම සේවාව පවත්වාගෙන යනු ලබන මූල්‍ය ආයතනයට ඇති වගකීම් කවරේද;

(ii) එම සේප්පුවක ඇති ද්‍රව්‍ය අස්ථානගතවීම සම්බන්ධව මූල්‍ය ආයතනයකට එරෙහිව ගත හැකි නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඇතැම් මූල්‍ය ආයතනයන්හි ආරක්ෂිත සේප්පු සේවාව සඳහා විධිමත් ආරක්ෂාවක් නොමැති බවත්;

(ii) එම සේප්පු තුළ තැන්පත් කළ වටිනා දෑ නැති වීම සම්බන්ධව එම මූල්‍ය ආයතන නිසි ක්‍රියාමාර්ග නොගන්නා බවත්;

(iii) ඒ නිසා එකී සේවාලාභීන්ගේ වටිනා ද්‍රව්‍ය අවදානමකට ලක්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) (i) ආරක්ෂිත සේප්පු සේවාව විධිමත් කිරීමට රජය මැදිහත් වන්නේද;

(ii) එසේ නම්, ඒ කෙසේද; කවදා සිට සිදු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

5945/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DODD/HO/2/Admin/පත්කිරීම් හා 2015.02.05 දිනැති ලිපියෙන් යූ. අනුර එස්. වීරරත්න මහතා (ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ I) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ තනතුරට පත් කර ඇති බවත්;

(ii) පසුව එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පාලන)ගේ අංක DODD/HO/2/Admin/පත්කිරීම් හා 2015.02.19 දිනැති ලිපියෙන් එකී පත් කිරීම නැවත සංශෝධනය කරමින් ඒ මහතාව එකී දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ, අධ්‍යක්ෂ (ප්‍රජා මූල සංවිධාන) තනතුරට පත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වීරරත්න මහතාට ඉහත (අ) (i) හි සඳහන් තනතුර ලබා නොදීමට ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම්වරයාගේ සහ සමෘද්ධි විෂයයට අදාළ නොවන අමාත්‍යවරයෙකුගේ දේශපාලන මැදිහත්වීමක් සිදුවී තිබේද;

(ii) එවැනි මැදිහත්වීමක් සිදුවී ඇත්නම්, එය අනුමත කරන්නේද;

(iii) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ සමෘද්ධි විෂයට අදාළ කටයුතු ඉඩම් අමාත්‍යවරයාට පවරා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ තනතුර සඳහා යූ. අනුර එස්. වීරරත්න මහතා පත් කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6083/'15

ගරු ටී. බී. ඒකනායක මහතා,— මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින් සඳහා 2015 අතුරු අයවැයෙන් වැඩි කළ දීමනා ලබා දී නොමැති බව දන්නේද;

(ii) එම පිරිසට එකී දීමනා ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6086/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ, නාදුගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මහහේන/මඩිගෙවත්ත ඉඩම රජයට පවරාගෙන තිබේද;

(ii) එසේ නම්, එම පවරා ගැනීම සිදු කළ දිනය කවරේද;

(iii) එම ඉඩම කුමන කටයුත්තක් සඳහා පවරා ගනු ලැබුවේද;

(iv) පවරා ගත් ඉඩමේ ප්‍රමාණය කොපමණද;

(v) එම ඉඩමේ නීත්‍යානුකූල හිමිකරු වන ජිනදාස කුමානායක මහතාට ඉඩම පවරා ගැනීමට අදාළව වන්දි මුදල් පිරිනමා තිබේද;

(vi) නොඑසේ නම්, ඊට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5722/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස, හුලංදාව වතුයාය ආශ්‍රිතව ජීවත් වන ජනතාවට අවම මූලික පහසුකම්වත් නොමැති බවත්;

(ii) එම නිසා එම ජනතාව දැඩි අපහසුතාවන්ට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හුලංදාව වතුයාය ආශ්‍රිතව වෙසෙන ජනතාවට අවශ්‍ය පානීය ජලය, මාර්ග පහසුකම්, නිවාස හා සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

(iii) එම පියවර ගනු ලබන දිනය කවරේද;

(iv) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6084/'15

ගරු ටී. බී. ඒකනායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එක ගමකට එක වැඩක් වැඩසටහන යටතේ 2015 සංවර්ධන යෝජනා සඳහා 25% ශ්‍රම දායකත්වය ලබා ගැනීමට නිර්දේශයට අනුව එම ශ්‍රම දායකත්වය ලබා ගැනීමට කටයුතු කරන්නේ කෙසේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා මූලික වියදම් දැරීමට ක්‍රමයක් යෝජනා කරන්නේද;

(iii) 25% ශ්‍රම දායකත්වය ලබා ගැනීමට නොහැකි යෝජනා ඇත්නම්, ඒවා ක්‍රියාත්මක කරන්නේ කෙසේද;

(iv) එවැනි අවස්ථාවල ශ්‍රම දායකත්වය 5% දක්වා අඩු කිරීමට කටයුතු කිරීමට හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6087/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හබරාදූව, කටුකුරුන්ද, මීපේ පාර යන ලිපිනයෙහි පදිංචි නුවන් ජයලත් සමරසේකර, හල්දුම්මුල්ල, සොරමුණේ "ජයරත්න" ලිපිනයෙහි පදිංචි චතුරංග වැලිකුඹුර සහ ගම්පහ, ඉදිගොල්ල, බණ්ඩාරනායකපුර, 2 වැනි පටුමගේ, අංක 93 ඒ 25 ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. පියුම් චින්තක කුලරත්න යන තිදෙනා 2013 වර්ෂයේ මාර්තු මස ඉරානයේ දී අත්අඩංගුවට පත්ව, දැනට වසරකට වැඩි කාලයක් එම රටෙහි සිරගතව සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත නම් සඳහන් තැනැත්තන් සිරගත කිරීමට හේතුව කවරේද;

(ii) එම තිදෙනා ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (කොන්සියුලර්) ගේ අංක FA/cons/cs/iran/13/02 ලිපියට අනුව, ඉරාන නීති උල්ලංඝනය කරමින් එරටට ඇතුළුවීම සහ භාණ්ඩ සොරකමක් හේතුවෙන් ඉහත නම් සඳහන් තිදෙනාට ඉරාන් රියාල් 5,000,000 ක සහ 10,490,834,000ක දඩ මුදලක් සමග වසර 2ක සිරදඬුවමක් නියම කර ඇති තත්ත්වය යටතේ ඔවුන් මෙරටට ගෙන්වා ගැනීමට විදේශ අමාත්‍යාංශයට මැදිහත් විය හැක්කේද;

(ii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගත හැකි පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 ජූනි මස 26 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5451/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ගංගා ආශ්‍රිතව අනවසර වැලි ගොඩ දැමීම්, මැණික් ගැරීම් හා රත්රන් කැනීම් සිදුවන බවත්;

(ii) මේ නිසා එම ගංගාවන්ට විශාල වශයෙන් හානි සිදුවන බවත්;

(iii) එය ජන ජීවිතයට ද සෘජුව බලපාන බවත්;

(iv) අදාළ ආයතනවලට එම අකටයුතුකම් වැලැක්වීමට ප්‍රමාණවත් පහසුකම් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගංගා ආශ්‍රිතව සිදුවන උක්ත අකටයුතුකම් මැඩලීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවරයන් කවරේද;

(iii) 2013.01.01 දින සිට 2014.06.30 දින දක්වා (අ)(i)හි සඳහන් වැරදි පිළිබඳව ලැබුණු පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සම්බන්ධව ගත් නීති ක්‍රියාමාර්ගය එක් එක් පැමිණිල්ල අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) උක්ත පරිසර හානි මැඩලීමට දැනට පවත්නා නීති පද්ධතිය ප්‍රමාණවත් වන්නේද;

(ii) නොඑසේ නම්, පවතින නීති වෙනස් කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6030/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහවැලි "සී" කලාපයට අයත්, අල්ල - කන්තලේ ව්‍යාපාරය යටතේ ගොවිතැන් කටයුතු සඳහා ගොවි සමිති හරහා තාවකාලික කම්කරුවන් බඳවාගෙන සිටි බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි තාවකාලික සේවයේ යොදවා සිටි කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා සේවා කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වසර 8ක පමණ කාලයක සිට තාවකාලික කම්කරුවකු ලෙස සේවය කර ඇති අල්ල පාර, සූරියපුර, කන්තලේ පදිංචි එස්. එම්. අබේමැණිකේ මහත්මියගේ රැකියාව පසුගිය ජනවාරි මස සිට නතර කිරීමට හේතුව කවරේද;

(iv) නව රජය පත්වී ගත වූ කාලය ඇතුළත ඉහත පරිදි සේවය අහිමි කර ඇති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ගේ නම්, ලිපිනයන් සහ සේවය කළ මහවැලි කලාපය කවරේද;

(vi) ඉහත පරිදි රැකියා අහිමි කළ පිරිස් සඳහා රැකියා ලබා දෙන්නේද;

(vii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6068/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මතුරට වැවිලි සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගමක් වන්නේද;

(ii) එම සමාගමේ කොටස් එහි සේවකයින් වෙත නිකුත් කර තිබේද;

(iii) එසේ නම්, එම කොටස් සහතික පත්‍ර මේ වන විට ඔවුන් වෙත පිරිනමා තිබේද;

(iv) එම කොටස් ලාභාංශ හෝ වෙනත් කුමන හෝ ප්‍රතිලාභයක් ලබා නොමැති කොටස්කරුවන් සිටින්නේද;

(v) එසේ නම්, ඊට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6085/'15

ගරු ටී. බී. ඒකනායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් 2014 වර්ෂයේදී ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළ බව දන්නේද;

(ii) 2014.12.31 දිනට වැඩ අවසන් කළ ව්‍යාපෘති සඳහා සහ 2014.12.31 ට පෙර ආරම්භ කළ ව්‍යාපෘති සඳහා මුදල් ලබා දෙන්නේද;

(iii) එම ගෙවීම් ප්‍රමාද කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6098/'15

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුම්රිය දෙපාර්තමේන්තුවේ පිළිගත් සම්ප්‍රදාය අනුව දුම්රිය සාමාන්‍යාධිකාරි ලෙස පත්වීම් ලබනුයේ එහි ජ්‍යෙෂ්ඨතම ඉංජිනේරුවරයා බවත්;

(ii) එම සම්ප්‍රදායට අනුව පත්කර සිටි, වැඩ බලන දුම්රිය සාමාන්‍යාධිකාරි ඉවත් කර 2014.10.16 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමතිය මගින් ජ්‍යෙෂ්ඨත්වයෙන් 09 වැනි ස්ථානයේ පසු වූ අයෙකු එම තනතුරට පත්කර ඇති බවත්;

(iii) එසේ පත් කළ වත්මන් වැඩ බලන දුම්රිය සාමාන්‍යාධිකාරි මාතර - කතරගම දුම්රිය මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා ලෙස ද කටයුතු කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(ii) හි සඳහන් පරිදි සුදුසුකම් සපුරා සිටි වැඩ බලන දුම්රිය සාමාන්‍යාධිකාරී එම තනතුරෙන් ඉවත් කිරීමට හේතු කවරේද;

(ii) එම ඉවත් කිරීමේදී යම් අසාධාරණයක් හෝ අක්‍රමිකතාවයක් සිදු වී තිබේ නම්, එය නිවැරදි කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6103/'15

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ මේ වන විට ක්‍රියාත්මක වන ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ව්‍යාපෘතියෙහි වටිනාකම හා එම ව්‍යාපෘතිය අවසන්වීමට නියමිත දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පුරනැගුම ව්‍යාපෘතියක් ලෙස කොළඹ දිස්ත්‍රික්කයේ, අවිස්සාවේල්ල මැතිවරණ කොට්ඨාසයේ, සීතාවක ප්‍රාදේශීය සභාව යටතේ ඉදිකරනු ලබන පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ පුස්තකාල සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන දිනය කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6104/'15

ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දින 100 වැඩ සටහන යටතේ රජයේ සේවකයෙකුට රු.10,000/-ක වැටුප් වැඩිවීමක් ලබා දීමට යෝජනා කර තිබුණේද;

(ii) එම යෝජනාව ඉදිරිපත් කරනු ලැබුවේ ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින්ද; නැතහොත්, ජනාධිපති ධුර අපේක්ෂකයෙකු වූ ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා විසින්ද;

(iii) නොඑසේ නම්, එය ඉදිරිපත් කළ අය කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දින 100 වැඩ සටහනෙහි කාල සීමාව මේ වන විට අවසන්ව ඇතත්, ඉහත (අ)(i)හි සඳහන් යෝජනාව අනුව මෙතෙක් ලබාදී ඇත්තේ රු. 5000/- පමණක් බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) වැටුප් වැඩිවීමට අදාළ ඉතිරි රු. 5000/- ජුනි මාසයේ දී ලබාදිය හැකිද;

(ii) ඒ සඳහා තවදුරටත් කාලය අවශ්‍ය වන්නේ නම්, ඒ කුමන දිනය දක්වාද;

(iii) ඉතිරි රු 5000/- සහ සියලු දීමනා මූලික වැටුපට එකතු කරන්නේ නම්, එම දිනය කවරේද;

(iv) ඒ අනුව හිඟ මුදල් සහ ඉතිරි වැටුප් ගෙවන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) රජයේ වැටුප් ගෙවීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ණය මුදලක් ලබා ගෙන තිබේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

5454/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ඔවුන් සතුව ඇති නොදියුණු තාක්ෂණික උපකරණ මගින් නිවැරදි කාලගුණ අනාවැකි ලබා දීමට අපොහොසත් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට දියුණු මානව හා භෞතික සම්පත් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ලබාදීමට බලාපොරොත්තු වන නවීන තාක්ෂණික උපකරණ කවරේද;

(iii) එම නවීන උපකරණ කුමන කටයුතු සඳහා භාවිතා කරන්නේද;

(iv) එම උපකරණ සඳහා වැය වන මුදල කොපමණද;

(v) නවීන තාක්ෂණික උපකරණ ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6032/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යාන්ඔය වාරි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, 232 ඒ, පඹුරුගස්වැව ග්‍රාම නිලධාරී වසමේ ජීවත් වන පවුල් 176 ක් ඉවත් කිරීමට යෝජිතව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ජනතාවට නව ඉඩම් ලබාදීමේදී ඔවුන් යුද සමයේදී ආරක්ෂක අංශ වෙත ලබාදුන් සහයෝගය වෙනුවෙන් විශේෂත්වයක් සිදුකිරීමටත්, ඔවුන්ගේ මුල් වාසභූමිවලට ආසන්නතම ප්‍රදේශයකින් ඉඩම් ලබාදීමටත් කටයුතු කරන්නේද;

(ii) ඔවුන් මේ වන විටත් වගා කරන කුඹුරු අතරින් යාන්ඔය නව ජලාශයට යට නොවන කුඹුරු ඉඩම් ඔවුන්ටම ලබා දෙන්නේද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ පුල්මුඩේ දක්වා ඉදිවන වේල්ලේ උතුරු ප්‍රදේශයේ පිහිටා ඇති ලඳු කැලෑ සහිත භූමියෙන් ඔවුන්ට අවශ්‍ය ගොඩ ඉඩම් ලබා දෙන්නේද;

(iv) ත්‍රස්තවාදී තර්ජන පැවැති සමයේදී ද අක්කර 5-6 ක වපසරියක ගොවිතැන් කටයුතු කළ එම ජනතාවට දැනට ලබා දීමට යෝජිත ගොඩ ඉඩම් අක්කර 1/2 සහ කුඹුරු අක්කර 1 1/2 වෙනුවට ගොඩ ඉඩම් අක්කරයක් සහ කුඹුරු අක්කර දෙකක් ලබාදීම අනුමත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6088/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 / 2015 මහ කන්නයේ වී වගාකළ ගොවීන්ට බිත්තර වී සහනාධාර ලබාදෙන බවට 2015 අයවැය මගින් කළ යෝජනාව පරිදි එම සහනාධාර මුදල් ගෙවීම මේ වන විට සිදු කර තිබේද;

(ii) බදුල්ල දිස්ත්‍රික්කයේ වී ගොවීන්ට එම සහනාධාර මුදල් ලබා දීමට අවශ්‍ය ප්‍රතිපාදන 2014.11.21 දින වනවිට ලැබී තිබුණේද;

(iii) එසේ නම්, එම ගොවීන්ට එකී සහනාධාර ලබා දීම ප්‍රමාද කිරීමට හේතු කවරේද;

(iv) බදුල්ල දිස්ත්‍රික්කයේ වී ගොවීන්ට අමතරව, සියලුම වී ගොවීන්ට ප්‍රමාදයකින් තොරව බිත්තර වී සහනාධාරය ලබා දීමට කටයුතු නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6100/'15

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත මිහින් ලංකා (පෞද්ගලික) සමාගම වර්ෂ 2013 සිට මේ දක්වා ලැබූ අලාභය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2011 වර්ෂයේ සිට මේ දක්වා එම ආයතනයට මහා භාණ්ඩාගාරයෙන් ලබා දී ඇති මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සීමාසහිත මිහින් ලංකා (පෞද්ගලික) සමාගමේ වත්මන් මූල්‍ය තත්ත්වය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5459/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පොලිස් ස්ථාන වෙත ලබා දීම සඳහා 2014 වර්ෂයේ මැද භාගයේදී ආනයනය කළ යමහා XJ6 කාණ්ඩයේ යතුරුපැදි සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(iii) එම යතුරුපැදි ලබා දී ඇති පොලිස් ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් යතුරුපැදියක වටිනාකම තීරණය කිරීමේදී අදාළවන යතුරුපැදියේ මූලික මිල, නැව් ගාස්තු, රජයේ බදු ගාස්තු ආදී අනෙකුත් වියදම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම වර්ගයේ යතුරුපැදි ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වාහන වෙළඳපොළේදී මිලදී ගැනීමේ හැකියාවක් තිබේද;

(iii) එසේ නම්, එම යතුරුපැදියේ මිල කොපමණවේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6089/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය භාෂා පරිවර්තක සේවය සඳහා භාෂා පරිවර්තකයින් අවසන් වරට බඳවා ගන්නා ලද වර්ෂය කවරේද;

(ii) එම බඳවා ගැනීම සඳහා උපයෝගීකරගත් සේවා ව්‍යවස්ථාව කවරේද;

(iii) භාෂා පරිවර්තක සේවය සඳහා නව සේවා ව්‍යවස්ථාවක් හඳුන්වා දී තිබේද;

(iv) නොඑසේ නම්, එවැන්නක් හඳුන්වාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය භාෂා පරිවර්තක සේවයේ තනතුරු සඳහා අවශ්‍ය වන සුදුසුකම් කවරේද;

(ii) භාෂා පරිවර්තක තනතුරට ආසන්න සුදුසුකම ලෙස පළපුරුද්ද හෝ එම ක්ෂේත්‍රයේ හැදෑරූ ඩිප්ලෝමා සහතිකය පිළිගන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් පවත්වනු ලබන පරිවර්තන විධි සහ වාචික පරිවර්තන කුසලතා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව භාෂා පරිවර්තන සුදුසුකමක් ලෙස පිළිගන්නේද;

(v) එසේ නම්, 2013 (2014) විභාග සඳහා පෙනී සිටීමට එම සුදුසුකම පිළිගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?